# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2016-02-12 |

පැමිණිලිකරු : ජේ.ජේ.එස්.එම්. වීරක්කොඩි මිය.
71/18, කවුඩාන පාර,
අත්තිඩිය,
දෙහිවල.

වගඋත්තරකරුවන් : සභාපති,
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධනය කිරීමේ සංස්ථාව,
වැලිකඩ,
රාජගිරිය.

<u>පැමිණිලි අංකය : HRC/5005/13</u>

**පැමිණිල්ල මගින් ඉදිරිපත් කර ඇති කරුණු :-**

පැමිණිලිකාරිය වන ජේ.ජේ.එස්.එම්. වීරක්කොඩි මහත්මිය විසින් 2013.12.20 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, තමා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු (සැපයුම්) තනතුරෙහි දැනට සේවය කරන බවත්, සහකාර සාමාන්‍යාධිකාරි (සැපයුම් ) තනතුරෙහි වැඩ බැලීමද සිදු කරන ලද බවත්ය. මොරටුව විශ්ව විද්‍යාලයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාධාරිනියක් වන පැමිණිලිකාරිය 1982.03.15 වන දින ඉංජිනේරු සහකාර (සිවිල්) III වන ශ්‍රේණියේ නිලධාරිනියක වශයෙන් එකී සංස්ථාවේ සේවයට බැදී ඇති අතර අනතුරුව 1985.05.01 වන දින ඉංජිනේරු සහකාර II තනතුරට ද 1991.06.01 වැනි දින ඉංජිනේරු සහකාර (සිවිල්) I තනතුරටද 1993.10.13 වන දින ඉංජිනේරු සහකාර (සිවිල්) විශේෂ ශ්‍රේණියේ තනතුරකට 2003.05.07 දින සිට ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණියේ තනතුරකට 2005.07.01 දින සිට ඉංජිනේරු (සිවිල්) I ශ්‍රේණියේ තනතුරකට උසස්වීම් ලබා ඇති අතර අනතුරුව 2005.06.16 දින කළමණාකරු (සැපයුම්) තනතුරටද 2010.08.01 දින ජ්‍යෙෂ්ඨ කළමණාකරු (සැපයුම්) තනතුරටද උසස් කරනු ලැබ ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කින්සි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිල්ලෙන් ඉල්ලා ඇති සහනයන් :-**

2011.11.01 සහ 2013.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙලින් රු. 15,000/-ක් සහ රු. 10,000/-කින් වැඩි කරන ලද ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව හිඟ මුදල් සහිතව ලබා ගැනීමත්.

සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුරෙහි වැඩ ආවරණය කරන ලද 2011.06.14 දින සිට 2011.11.01 දින දක්වා කාල සීමාව සඳහා අදාළ දීමනාව ලබා ගැනීමත්.

මානව හිමිකම් කොමිෂන් සභාවේ මූලික නිර්දේශයන්ට අනුකූල වන පරිදි කළමණාකරු (සැපයුම්) තනතුරෙහි පිහිටුවීම 2002.12.17 දින දක්වා පෙරදාතම් කිරීමත්.

නිරුඛද්‍ර රහිත වාහන බලපත්‍රය ලබා ගැනීමට ඇති හිමිකම තහවුරු කිරීම හා එය ලබාදීමට කටයුතු කිරීමත්.

සහකාර සාමාන්‍යාධිකාරී තනතුරට පත්වීමට ඇති හිමිකම තහවුරු කිරීම සහ එම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අභ්‍යන්තරිකව අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීමට නියම කිරීමත්.

පදනම් විරහිත ලෙස සහ අවිචාරවත් ලෙස සිදු කරන ලද ස්ථාන මාරුවීම් ලබාදීම වැළැක්වීම සහ ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයට නැවත ස්ථානමාරු කිරීමට කටයුතු කිරීමත් මෙම පැමිණිල්ල මගින් අපේක්ෂිත සහන ලෙසට දක්වා ඇත.

**පැමිණිල්ලේ වැඩිදුර කරුණු දැක්වීම සහ වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම -:**

**2011.11.01 සහ 2013.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙලින් රු. 15,000/- කින් සහ රු.10,000/- කින් වැඩි කරන ලද ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව හිඟ මුදල් සහිතව ලබා ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, වගඋත්තරකාර ආයතනය තුළ ඉංජිනේරුවන් රඳවා ගැනීමේ පරමාර්ථය ඇතිව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව වශයෙන් රු. 3,000/-ක මුදලක් ගෙවීම ආරම්භ කළ අතර එය පැමිණිලිකාරිය වෙත ගෙවනු ලැබූ බවයි. තවද ඒ වන විටත් ඇයගේ තනතුරු නාමය සැපයුම් කළමණාකරු ලෙස වෙනස් කර තිබුනද උසස්වීමේ පටිපාටියට අනුව මූලික සුදුසුකම ඉංජිනේරු I ශ්‍රේණිය බැවින් ඇයට එම දීමනාව හිමිවී තිබූ බවත් එහි ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව 2011.01.01 දින හා 2013.11.01 දින පිළිවෙලින් රු. 15,000/-

කින් හා රු. 10.000/-කින් වැඩි කරන ලද නමුදු එකී මුදල පැමිණිලිකාරිය වෙත නොගෙවන ලද බවත් මෙසේ එකී මුදල අහිමිකර ඇත්තේ පැමිණිලිකාරියට පමණක් බවත් සඳහන් කර ඇත.

ඉහත කරුණු සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ 2002.11.14 වන දින කළමණාකරු (සැපයුම්) තනතුර සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයට ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වුවද පැමිණිලිකාරිය එකී තනතුර සඳහා තෝරා ගනු නොලැබූ හෙයින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ නිර්දේශය මත 2005.06.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමණාකාර (සැපයුම්) තනතුරට පත් කරනු ලැබූ බවයි. තවද මෙම දීමනාව ඉංජිනේරු තනතුර දරන්නන්ට පමණක් ඔවුන් රඳවා ගැනීමේ පරමාර්ථයෙන් ගෙවන බවත් 2014.09.25 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවට එවන ලද වාර්තාවේ සඳහන්ව ඇත. තවද පැමිණිලිකාරිය කළමණාකරු (සැපයුම්) තනතුරට සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාර (සැපයුම්) තනතුරට පත්කිරීමෙන් පසුව ඉංජිනේරු කාර්යයන්ගෙන් ඉවත් වී ඇති බවත් ඒ අනුව ඇයට ඉංජිනේරු කාර්ය මණ්ඩලයට ගෙවන දීමනා සඳහා හිමිකමක් නොමැති බවත් සඳහන් කර ඇත.

ඉහත වගඋත්තරකරුගේ කරුණු දැක්වීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය පෙන්වා දී ඇත්තේ ඉංජිනේරුමය දීමනාව ඉංජිනේරුවන් සංස්ථාවේ රඳවා ගැනීමේ මූලික පරමාර්ථයෙන් ගෙවනු ලබන හෙයින් වෘත්තියෙන් ඉංජිනේරුවරියක වන තමන්ට ද එකී දීමනාව සඳහා හිමිකමක් ඇති බවයි. තවද පැමිණිලිකාරිය ජ්‍යෙෂ්ඨ කළමණාකාර (සැපයුම්) තනතුරට පත්වීමෙන් අනතුරුව එවකට ඉංජිනේරුවන් සඳහා ගෙවනු ලැබූ රු.4.000/- දක්වා වැඩිකර එම දීමනාව ඇයට තවදුරටත් ගෙවනු ලැබූ බවත් ඇය සැපයුම් අංශයට ස්ථානමාරු කරන ලද්දේ සේවා අවශ්‍යතාවය මත බවත් ඉන් පසුව ගෙවන ලද වැඩිකරන ලද රු. 15.000/- ක හා රු. 10.000/- ක දීමනා පමණක් ඇයට අහිමිකිරීම පදනම් විරහිත කරුණක් බවත් දක්වා ඇත.

ඉහත කරුණු සනාථ කිරීම සඳහා රුපියල් 4.000/-ක ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව ඇය වෙත ලබාදී ඇති බව සනාථ කරන ලිපියක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

**සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුරෙහි වැඩ ආවරණය කරන ලද 2011.06.14 දින සිට 2011.11.01 දින දක්වා කාල සීමාව සඳහා අදාළ දීමනාව ලබා ගැනීම**

ඉහත කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය දන්වා ඇත්තේ එවකට වැඩ බලන සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) වශයෙන් සේවය කළ පී. ජයවර්ධන මහතා (ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු යාන්ත්‍රික ලෙස) පෞද්ගලික හේතු මත එකී තනතුරෙන් ඉවත්වීම නිසා පැමිණිලිකාරිය එකී තනතුරෙහි වැඩ බැලීමට 2011.06.14 දින සිට පත්කරන ලද බවයි. 2011.11.01 දින දක්වා එම තනතුරහි වැඩ බැලීම සිදු කර ඇත. පැමිණිලිකාරිය දන්වා ඇත්තේ එසේ වැඩ බැලීමට තමා පත්

කර ඇත්තේ තමාගේ ඉල්ලීමකින් තොරව ආයතනයේ සැපයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට බවයි. එසේ 2011.06.14 දින සිට 2011.11.01 දින දක්වා වැඩ බැලීමේ කාර්යය සිදු කිරීම සඳහා කිසිදු දීමනාවක් ඇයට ගෙවීම සිදු කර නොමැති බවද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව එවැනි දීමනාවක් ලබා ගැනීමට ඇයට හිමිකම ඇති බවද තමාට කලින් වැඩ බලමින් සිටි නිලධාරියාට එවැනි දීමනාවක් ගෙවනු ලැබූ බවද සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් 2014.09.25 දිනැතිව වගඋත්තරකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවට එවන ලද වාර්තාවට අනුව වගඋත්තරකරුගේ ස්ථාවරය වී ඇත්තේ සුදුසු නිලධාරියෙකු පත්කර ගන්නා තෙක් සහකාර සාමාන්‍යාධිකාරී තනතුරෙහි වැඩ ආවරණය කිරීම සඳහා පැමිණිලිකාරිය පත්කරනු ලැබූ බවයි. පුරප්පාඩු වී ඇති තනතුරක තාවකාලිකව රාජකාරී ආරවණය කිරීම සඳහා නිලධරයෙකු පත්කර ලැබ ඇති අවස්ථාවකදී එම තනතුරෙහි රාජකාරී හේතු කොට ගෙන ඒ සඳහා අමතර දීමනාවක් ගෙවීමට ප්‍රතිපාදන නොමැති බවද දන්වා ඇත.

තවද ඉහත කරුණු සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශවය 2015.06.09 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවැත්වූ පරීක්ෂණයේදී ද සඳහන් කර ඇත්තේ පී.ජයවර්ධන මහතා සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුරේ වැඩ බැලීම සිදුකළ බැවින් ඔහුට එම දීමනාව ලබාදුන් බවත් මෙහිදී පැමිණිලිකාරිය සිදු කර ඇත්තේ වැඩ බැලීමක් නොව වැඩ ආවරණය කිරීමක් බවත් එම නිසා එම දීමනාව ඇයට හිමි නොවන බවත්ය.

ඉහත වගඋත්තරකරුගේ කරුණු දැක්වීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත්තේ තනතුරක වැඩ බැලීම සඳහා පත්කරනු ලබන නිලධාරියෙකුට වැඩ බැලීමේ දීමනාවක් ගෙවීමට ආයතන සංග්‍රහයට අනුව ප්‍රතිපාදන ඇති බවයි. මින් පෙර කළමණාකරු (සැපයුම්) තනතුරෙහි වැඩ බැලීම කළ එස්.එම්.පී. කුමාරසිරි මහතාට වැඩ බැලීමේ දීමනාවක් වශයෙන් එකී තනතුරේ ආරම්භක වැටුපෙන් 25% ක දීමනාවක් ගෙවා ඇති බවත්, කුමාරසිරි මහතාට එවැනි දීමනාවක් ගෙවා තිබීම පැමිණිලිකාරියගේ හිමිකම් කියා පෑමට පූර්වාදර්ශයක් වන බවත්ය.

**මානව හිමකම් කොමිෂන් සභාවේ මූලික නිර්දේශයන්ට අනුකූල වන පරිදි කළමණාකරු (සැපයුම්) තනතුරෙහි පිහිටුවීම 2002.12.17 දින දක්වා පෙර දාතම් කිරීම.**

ඉහත කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් දන්වා ඇත්තේ HRC/3243/2005 යන අංකය යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කර තිබූ අතර ඒ පිළිබඳව පරීක්ෂණයෙන් පසුව 2002.12.07 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකාරිය කළමණාකරු (සැපයුම්) තනතුරෙහි පිහිටුවිය යුතු බවට නිර්දේශ කොට ඒ බව 2006.07.06 දිනැති ලිපිය මගින් වගඋත්තරකාර ආයතනය වෙත දන්වා තිබූ බවයි. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය ලැබීමට බොහෝ කලකට පෙර පැමිණිලිකාරියට එම පත්වීම ලබාදීම

වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.03.18 දින ද අමාත්‍යාංශ ලේකම් වරයා විසින් 2005.06.16 දින ද අනුමත කර තිබූ බව සඳහන් කර ඇත. එහෙත් වගඋත්තරකාර සංස්ථාව විසින් එකී නිර්දේශය නොසලකා හරිමින් 2007.10.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකී පත්වීම ලබාදී තිබූ බවද. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය වගඋත්තරකාර සංස්ථාව වෙත ලැබීමෙන් පසුව එකී සංස්ථාව වෙනුවෙන් දක්වන ලද කරුණු මත පැමිණිලිකාරියගෙන් කරුණු විමසීමකින් තොරව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිලිකාරිය සම්බන්ධයෙන් වූ එකී නිර්දේශය 2002 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය යුතුය යන්න 2005 දක්වා වෙනස්වන ලෙසට වෙනස්කර තිබූ බවද මේ අනුව වගඋත්තරකරු පැමිණිලිකාරියගේ එකී පත්වීම 2005.06.16 දිනට පෙරදාතම් කරන ලද බවද මේ හේතුවෙන් පැමිණිලිකාරියගේ ජ්‍යෙෂ්ඨතාවය වසර 10කින් පමණ පහත වැටී ඇති බවද සඳහන් කර ඇත.

මෙම කාරණය සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තරකරු විසින් දන්වා ඇත්තේ, HRC/3242/05 පැමිණිල්ල පිළිබඳව පරීක්ෂණ පැවැත්වූ මානව හිමිකම් කොමිෂන් සභාව කළමණාකරු සැපයුම් තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දිනය වූ 2002.12.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකාරිය එම තනතුරෙහි පිහිටවිය යුතු බව නිර්දේශ කරනු ලැබ තිබූ බවත් කළමණාකාර සැපයුම් තනතුරෙහි එවනකට වැඩ බලමින් සිටි කුමාරසිරි මහතා විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් පිළිබඳව නිසි පරිදි විමර්ශනය නොකරන ලද බවට කරුණු තිබූ අතර කෙසේ වෙතත් ඒ මහතා 2007.10.15 වන දින විශ්‍රාම ගැනීමෙන් පසුව එදින සිට ක්‍රියාත්මක වන පරිදි පැමිණිලිකාරිය එම තනතුරට පත්කරනු ලැබූ බවත්ය. වගඋත්තරකාර සංස්ථාව විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව වැඩිදුරටත් පරීක්ෂණ පවත්වා පැමිණිලිකාරියට හිමි වැටුප් රහිතව එකී පත්වීම 2005 වසර දක්වා පෙරදාතම් කළයුතු බවට නිර්දේශ කරනු ලැබූ බවද දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකාරිය කළමණාකරු (සැපයුම්) තනතුරට පත් කිරීම 2005.06.11 වන දින දක්වා පෙරදාතම් කර ඇති බව 2014.09.25 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එවන ලද වාර්තාවේ සඳහන්ව ඇත.

**තිරු බදු රහිත වාහන බලපත්‍රය ලබා ගැනීමට ඇති හිමිකම තහවුරු කිරීම හා එය ලබාදීමට කටයුතු කිරීම.**

ඉහත කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය සහනයක් ලබා දෙන ලෙසට මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලේ සඳහන්ව තිබුනද මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ අවසන් පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ අදාළ තිරුබදු රහිත බලපත්‍රය දැනටමත් ලබාදී ඇති බව සඳහන් කර ඇති බැවින් ඉහත කරුණු සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය නොවන බව පෙනී යයි.

සහකාර සාමාන්‍යාධිකාරී තනතුරට පත්වීමට ඇති හිමිකම තහවුරු කිරීම සහ එම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අභ්‍යන්තරිකව අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීමට නියම කිරීම.

ඉහත කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකරිය දන්වා ඇත්තේ සංස්ථාවේ ප්‍රතිපත්තිය වී තිබුයේ සංස්ථාවේ කිසියම් තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට පළමුව අභ්‍යන්තරව සුදුසුකම් ඇති අයගෙන් තෝරා ගන්නා අතර එසේ සුදුසුකම් ඇති තැනැත්තන් නොමැති නම් බාහිරව අයදුම්පත් කැඳවීම වන බවයි. සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුර සම්බන්ධයෙන් මෙම ක්‍රියා පරිපාටිය අනුගමනය කර නොමැති අතර. අභ්‍යන්තරව අයදුම්පත් නොකැඳවා බාහිරව අයදුම්පත් කැඳවා අදාළ දැන්වීමේ දක්වා තිබූ සුදුසු නොමැති අයෙකු පත්කර ඇති බවද සඳහන් කර ඇත.

මේ සම්බන්ධයෙන් වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ. සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුරෙහි පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුන් තේරීම සඳහා වූ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවන ලද බවයි. පැමිණිලිකාරියටද ඒ අනුව සුදුසුකම් තිබුනේ නම් අයදුම් කළහැකිව තිබූ බවත්. නමුත් ඇය එම තනතුර සඳහා අයදුම් කර නොතිබූ බවත් සඳහන් කර ඇත. පැමිණිලිකාරිය සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) තනතුරෙහි රාජකාරී කටයුතු ආවරණය කරනු ලැබුවද එසේ කටයුතු කිරීම එම තනතුර ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවන බවත් සඳහන් කර ඇත.

ඉහත වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රතිවිරෝධතාවයේ සඳහන්ව ඇත්තේ මෙම තනතුර සඳහා අභ්‍යන්තරව අයදුම්පත් කැඳවීමකින් තොරව බාහිරව අයදුම්පත් කැඳවා ඇති බවයි. පැමිණිලිකාරිය එකී තනතුර සඳහා උසස්වීම් පටිපාටියට අනුව වසර 03ක ජ්‍යෙෂ්ඨ කළමණාකරුවෙකු ලෙස පළපුරුද්ද වෙනුවට වසර 02ක පළපුරුද්දක් සපුරා තිබෙන අතර තෝරා ගනු ලැබූ තැනැත්තා වන ඩී. ධර්මරත්න මහතාට දැන්වීමේ සඳහන් සුදුසුකම් නොමැති බැවින් එම පුද්ගලයා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ බවත් සඳහන් කර ඇත.

**පදනම් විරහිත ලෙස සහ අවිචාරවත් ලෙස සිදුකරන ලද ස්ථානමාරුවීම් ලබාදීම වැළැක්වීම සහ ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයට නැවත ස්ථානමාරු කිරීමට කටයුතු කිරීම.**

ඉහත කරුණු සම්බන්ධයෙන් පැමිණිලිකාරිය දන්වා ඇත්තේ. රාජකාරී අවශ්‍යතාවය මත යැයි දක්වමින් පැමිණිලිකාරිය 2011.11.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ කළමණාකරු (සැපයුම්) තනතුර සඳහා පුරප්පාඩු නොතිබූ යන්ත්‍රෝපකරන අංශය වෙත ස්ථානමාරු කරන ලද බවයි. ඉන් පසු එසේ සේවය කරමින් සිටින අතරතුර ඉදිකිරීම් අංශයට 2013.11.01 දින සිට ස්ථානමාරුවක් ලබාදී පසුව ඉදිකිරීම් අංශයේ අත්තිඩිය වැඩ බිම වෙත ස්ථානමාරු කරන ලද

බවත්, එදින සිට ඇයට කිසිදු රාජකාරියක් පවරා නොතිබූ බවත්, රාජකාරි ලේඛනයක් ලබාදී නොතිබූ බවත්, කාර්යාල කාර්ය සහයකයෙකු පමණක් ලබාදී තිබූ බවත් සඳහන් කර ඇත.

ඉහත කාරණා සම්බන්ධයෙන් වගඋත්තරකරු වෙනුවෙන් 2015.09.22 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේ දී පැවැත්වූ පරීක්ෂණයේදී ප්‍රකාශ කර තිබුනේ කලින් සිටි සභාපතිවරයාගේ තීරණයකට අනුව මෙම ස්ථානමාරුවීම ක්‍රියාත්මක කර ඇති බවත් රාජකාරි ලැයිස්තු ලබාදීමද එම සභාපතිවරයාගේ තීරණයක් බවත් එකී තීරණ වෙනස් කිරීමට හැකියාවක් නොමැති බවත්ය.

**නිරීක්ෂණ :-**

ඉහත දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත කරුණු නිරීක්ෂණය කර ඇත.

01. **2011.11.01 සහ 2013.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙලින් රු. 15,000/-කින් සහ රු. 10,000/- කින් වැඩි කරන ලද ඉංජිනේරු කාර්ය මණ්ඩල දීමනාව හිග මුදල් සහිතව ලබා ගැනීම යන කරුණ සම්බන්ධයෙන් කොමිෂන් සභාව නිරීක්ෂණය කර** සිටින්නේ ඉංජිනේරුමය දීමනාව ගෙවීමේ පරමාර්ථය දැනට සංස්ථාවේ සේවය කරනු ලබන ඉංජිනේරුවන් සංස්ථාවේම සේවය සඳහා රඳවා ගැනීම බවයි. පැමිණිලිකාරියට මුලදී ගෙවනු ලැබූ රු. 4000/-ක දීමනාව ගෙවනු ලැබුවද පසුව පිළිවෙලින් ගෙවනු ලැබූ රු.15000/-ක සහ රු.10,000/-ක වශයෙන් වැඩි කරන ලද දීමනාව ගෙවා නොමැති බවද නිරීක්ෂණය වේ. පැමිණිලිකාරිය කුමන තනතුරකට පත්වූවද සංස්ථාවේ සේවය කරන I ශ්‍රේණියේ ඉංජිනේරුවරියක් වේ. එසේම එම දීමනාවේ කොටසක් සඳහා හිමිකම් ලැබීමත් කොටසක් සඳහා හිමිකම් නොලැබීමත් පදනම් විරහිත කාරණාවක් බවද එම නිසා මෙම සම්පූර්ණ දීමනාව සඳහා ඇයට හිමිකමක් ඇති බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

02. සහකාර සාමාන්‍යාධිකරි (සැපයුම්) තනතුරෙහි වැඩ ආවරණය කරන ලද 2011.06.14 දින සිට 2011.11.01 දින දක්වා කාල සීමාව සඳහා අදාළ දීමනාව ලබා ගැනීම යන කාරණය සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් කරන ලද කරුණු දැක්වීමට අනුව පැමිණිලිකාරිය සහකාර සාමාන්‍යාධිකාරි (සැපයුම්) තනතුරෙහි කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත. පැමිණිලිකාරියට පෙර කළමණාකරු සැපයුම් තනතුරෙහි වැඩ බැලීම සිදු කළ එස්.එම්.පී කුමාරසිරි මහතා විශ්‍රාම යනතෙක් ඔහුට වැඩ බැලීමේ දීමනාව වශයෙන් එම තනතුරේ මූලික වැටුපින් 25% ක් ගෙවා ඇති අතර වගඋත්තරකරු කියා සිටින පරිදි අනතුරුව එම තනතුරේ කටයුතු කිරීම සඳහා

පත්කරන ලද පැමිණිලිකාරිය පත්කරනු ලැබ ඇත්තේ වැඩ ආවරණය කිරීමේ පදනම මත වේ. එම නිසා පැමිණිලිකාරියට එකී වැඩ බැලීමේ දීමනාවට හිමිකමක් නොමැති බවට වගඋත්තරකරු විසින් දක්වා ඇත. මෙහිදී පැමිණිලිකාරිය වැඩබැලීම සඳහා පත්කර ඇති බව සඳහන් කර තිබුණද වැඩබැලීම සඳහා වූ පත්වීම් ලිපියක් ඇය විසින් ඉදිරිපත් කර නොමැති බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. 2011.06.20 දින දාතමින් පැමිණිලිකාරිය වෙත ලබා දී ඇති ලිපියෙහි පැහැදිලිව සඳහන්ව ඇත්තේ 2011.06.14 දින සිට සහකාර සාමාන්‍යාධිකාරි තනතුරේ වැඩ ආවරණය කිරීම යනුවෙන්ය. තවද පැමිණිලිකාරිය විසින් වැඩබැලීමට අදාල සුදුසුකම් සපුරා තිබූ බවටද සාක්ෂි ඉදිරිපත් වී නොමැති බැවින් මෙම දීමනාව ඉල්ලා සිටීම පදනම් විරහිත බව නිරීක්ෂණය වේ.

03. මානව හිමිකම් කොමිෂන් සභාවේ මූලික නිර්දේශයන්ට අනුකූල වන පරිදි කළමණාකරු (සැපයුම්) තනතුරෙහි පිහිටුවීම 2002.12.17 දින දක්වා පෙරදාතම් කිරීම යන කාරණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ නිරීක්ෂණය වී ඇත්තේ පැමිණිලිකාරියගේ පත්වීම කොමිෂන් සභාවේ නිර්දේශයට අනුව දැනට 2005 දක්වා පෙරදාතම් කර ඇති බවයි. කොමිෂන් සභාව එහි මුල් නිර්දේශය වෙනස් කරනු ලැබ ඇත්තේ සංස්ථාව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති කරුණු සළකා බැලීමෙන් අනතුරුව යම් අසාධාරණයක් වැලැක්වීම පිණිස වන බවද නිරීක්ෂණය වේ. මුල් නිර්දේශය වෙනස් කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාරිය විසින් එයට විරුද්ධව කරුණු දැක්වීමක් සිදුකර නොමැත. එසේ කරුණු දැක්වීමක් නොකිරීමෙන් පෙනී යන්නේ ඇය එම වෙනස් කිරීම පිළිගෙන ඇති බවයි. එම නිසා එම ඉල්ලීමට අනුව කොමිෂන් සභාවට කටයුතු කිරීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය වේ.

04. නිරුබද්ධ රහිත වාහන බලපත්‍රය ලබා ගැනීමට ඇති හිමිකම තහවුරු කිරීම හා එය ලබාදීමට කටයුතු කිරීම යන කාරණය සම්බන්ධයෙන් පැමිණිලිකාරියට දැනටමත් සහනය ලැබී ඇති බව නිරීක්ෂණය වේ.

05. සහකාර සාමාන්‍යාධිකාරි තනතුරට පත්වීමට ඇති හිමිකම තහවුරු කිරීම සහ එම තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව අභ්‍යන්තරිකව අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීමට නියම කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වන්නේ යම්කිසි තනතුරක් ලබාදීම සම්බන්ධයෙන් ආයතනය විසින් මීට පෙර අනුගමනය කර ඇති පිළිවෙත වශයෙන් අභ්‍යන්තරව අයදුම්පත් කැඳවා සුදුස්සන් නොමැති නම් බාහිරව අයදුම්පත් කැඳවා අදාල සුදුස්සන් තෝරා ගැනීම බව පැමිණිලිකාරිය කියා සිටියද,

වගඋත්තරකරු පෙන්වා දී ඇත්තේ පැමිණිලිකාරියට සහකාර සාමාන්‍යාධිකාරි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් නොතිබූ බවයි. මෙහිදී පැමිණිලිකාරිය අදාල තනතුර සඳහා

ඉල්ලා ඇති සේවා පළපුරුද්ද සම්පූර්ණ කර නොමැති බව පෙනී යන අතර ඇය විසින් අදාළ තනතුර සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති බවද පෙනී යන බැවින් මෙම තනතුර සඳහා අභ්‍යන්තර අයදුම්පත් කැඳවීමට කොමිෂන් සභාව මගින් නියම කිරීම සඳහා එමගින් හැකියාවක් නොමැති බව නිරීක්ෂණය වේ.

06. පදනම් විරහිත ලෙස සහ අවිචාරවත් ලෙස සිදුකරන ලද ස්ථානමාරුවීම් ලබාදීම වැළැක්වීම සහ ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශයට නැවත ස්ථානමාරු කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වී ඇත්තේ පැමිණිලිකාරිය වෙත මෙම මාරුවීම ලබාදීම පිළිබඳව කිසිදු පදනමක් නොමැති බවයි. එයට හේතුව වන්නේ පැමිණිලිකාරියට අවසාන වශයෙන් අත්තිඩිය වැඩ බිමට ස්ථාන මාරුව ලබා දී තිබුනද ඇයට කිසිදු රාජකාරියක් පවරා නොතිබූ අතර රාජකාරි ලේඛනයක්ද ලබා දී නොතිබීම වන බවද නිරීක්ෂණය වේ. වගඋත්තරකරු විසින් 2015.09.22 දින මෙම කොමිෂන් සභාවේදී පැවැත්වූ පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ මෙය කලින් සිටි සභාපතිවරයාගේ තීරණයට අනුව සිදුවූ දෙයක් බවයි. ඒ අනුව පැමිණිලිකාරිය 2011 සිට විවිධ අවස්ථා වලදී ස්ථාන මාරු කර ඇති බව පෙනී යන බැවින් අවසාන වශයෙන් ඇය අත්තිඩිය වැඩබිම වෙත ස්ථාන මාරු කිරීම පදනම් විරහිත බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකාරියට හිමිවිය යුතු ඉංජිනේරුවන් සඳහා වූ දීමනාව ඇයට අහිමි කිරීම සම්බන්ධයෙන් කිසිදු නීත්‍යානුකූලව හෝ ලිඛිතව පිළිගත හැකි හේතුවක් නොමැති බැවින් එම දීමනාව ලබා නොදීම තුළින්ද. පදනම් විරහිතව ස්ථානමාරුව ලබාදී අත්තිඩියේ වැඩබිමේ රාජකාරියේ යෙදී සිටි කාලසීමාව තුළ කිසිදු රාජකාරියක් නොපැවරීම තුළින්ද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවෙන් ලබා දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

01. ඒ අනුව පැමිණිලිකාරියට හිමිවිය යුතු ඉංජිනේරුවන් සඳහා වූ දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙසද.

02. අත්තිඩියේ වැඩබිම වෙත කරන ලද ස්ථාන මාරුව අවලංගු කරන ලෙසද වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

2016.0[illegible]. 15 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. N. D. Udagama**
Chairperson
Human Rights Commission of Sri Lanka

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/R-2